**තේ ශක්ති අරමුදල - 2017**
**------------------------------------**

තේ ශක්ති අරමුදලේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් දෙවර්ෂයේ මෙහෙයුම් කටයුතු පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2000 අංක 47 දරන තේ ශක්ති අරමුදල් පනතේ 13(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 13(6) වගන්තිය ප්‍රකාර ඉදිරිපත් කළ යුතු 2016 සහ 2017 වර්ෂයන් සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මෙම වාර්තාවේ දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළයුතු යැයි අදහස් කරන සමාලෝචිත වර්ෂයේ අරමුදලේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවේ ඇතුළත් වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**
**--------------------------------------------------------------------**

අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**2. මූල්‍ය ප්‍රකාශන**
**------------------**

**2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.**
**------------------------------------**

2003 ජූනි 02 දිනැති අංක පීඊඞී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන සහ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2016 සහ 2017 යන වර්ෂයන්ගේ මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තා 2018 සැප්තැම්බර් 30 දින වන විටත් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**2.2 ගිණුම් පොත්පත් හා ලේඛන පැවැත්වීම**
**-----------------------------------------------**

සමාලෝචිත වර්ෂයේ අරමුදලේ කටයුතු සම්බන්ධයෙන් ලෙජර් ගිණුම්, අනෙකුත් පොත්පත් හා ලේඛන යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි.

**2.3 වත්කම් හා වගකීම්වල පැවැත්ම**
**---------------------------------------**

පසුගිය වර්ෂ දෙකෙහි අරමුදලේ වත්කම් හා වගකීම් විස්තර පහත පරිදි විය.

| විස්තරය | 2015 .12.31 දිනට | 2014.12.31 දිනට |
|---|---|---|
| | රු. | රු. |
| වත්කම් | | |
| ජංගම නොවන වත්කම් | 350,332,493 | 371,065,477 |
| ජංගම වත්කම් | 346,460,128 | 387,410,204 |
| වගකීම් | | |
| ස්කන්ධ ප්‍රාග්ධනය | (111,648,540) | (72,416,249) |
| ජංගම නොවන වගකීම් | 481,088,651 | 506,875,158 |
| ජංගම වගකීම් | 327,352,510 | 324,016,772 |
| | | |
| විකුණුම් | 573,519,262 | 621,589,674 |
| විකුණුම් පිරිවැය | (552,517,570) | (611,323,143) |
| දළ ලාභය | 21,001,692 | 10,266,531 |

## 2.4 ආයතනයේ අඛණ්ඩ පැවැත්ම

තේ ශක්ති අරමුදල පසුගිය වර්ෂ 5 තුළ අඛන්ඩව අලාභ ලබා තිබූ අතර අරමුදලේ ස්කන්ධ ප්‍රාග්ධනය ක්‍රමාණුකූලව අඩු වෙමින් පැවැතුණි. ඒ අනුව 2011 වර්ෂයේ දී රු. මිලියන 553.04ක් වූ ස්කන්ධ ප්‍රාග්ධනය 2015 වර්ෂයේ දී රු. මිලියන 111.65 ක සෘණ තත්ත්වයක් පෙන්නුම් කෙරිණි. මෙම තත්ත්වයන් මත 2016 ජුලි 13 දිනැති අංක 16/1427/726/015-I දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින් තේ ශක්ති අරමුදලේ අධ්‍යක්ෂ මණ්ඩලයේ කටයුතු එදින සිට අත්හිටුවා එහි කටයුතු වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත පවරා යෝජනා 09 කින් සමන්විත වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර අරමුදල ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා අනුමැතිය ලබා දී තිබුණි.

## 2.5 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය. | |
| (i) මුදල් රෙගුලාසි 386 (3) | ලියනු ලබන සෑම චෙක්පතකම, උප පත්‍රිකාවෙහි වවුචර් අංකය සඳහන් කළ යුතු නමුත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |

| | |
|---|---|
| (ii) මුදල් රෙගුලාසි 395(ආ) | එක් එක් මාසය අවසානයේ දී ඇති ගණුදෙනු තත්ත්වයන් සම්බන්ධයෙන් ඊලග මාසයේ 15 දිනට පෙර බැංකු සැසදුම් ප්‍රකාශනයන් පිළියෙල කළයුතු වුවද, 2017 දෙසැම්බර් 31 දිනට අරමුදලේ බැංකු ගිණුම් 07කට අදාලව බැංකු සැසදුම් ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 396 | වලංගු කාලය අවසන් වූ ගෙවීමට තිබෙන මාස 6 ට වැඩි බැංකුවට ඉදිරිපත් නොකළ චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කළයුතු වුවත් එකතුව රු.15,534 ක් වටිනා චෙක්පත් 6 ක් සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි. |
| (ආ) 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | රු. 4,565,247 ක් වූ පරිගණක හා මෘදුකාංග සඳහා ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |

## 2.6 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

2016 ජූලි 13 දිනැති අංක අමප/16/1224/726/015-1 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව අරමුදලට අදාළව සිදු කෙරෙන ඉදිරි කටයුතු සම්බන්ධයෙන් වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම්වරයා හා මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් තීරණ ගැනීම සිදුකළයුතු නමුදු 2016 සැප්තැම්බර් 27 දින සිට අමාත්‍යාංශයේ නිලධාරීන් වෙත මූල්‍ය බලතල පැවරීම සඳහා අමාත්‍යාංශ ලේකම් විසින් මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ එකඟතාවය ලබා ගෙන නොතිබුණි.

## 2.7 ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2015 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව දැරණියගල තේ කර්මාන්තශාලාවේ අමුද්‍රව්‍ය සඳහා සැපයුම්කරුවන්ට ගෙවිය යුතු මුදල රු.1,870,576 ක් වුවද 2016 වර්ෂයේදී ඒ වෙනුවෙන් රු. 3,235,085 ක මුදල් ගෙවා තිබුණි.

(ආ) බුලත්කොහුපිටිය හා පොතුපිටිය තේ කර්මාන්තශාලා ඉදිකිරීම 2003 වර්ෂයේ නවතා දමා තිබුණ ද එම කර්මාන්තශාලා ඉදිකිරීම සඳහා 2001 වර්ෂයේදී කොන්ත්‍රාත්කරුවන්ට ලබා දී තිබූ එකතුව රු.18,042,351 ක මුදලක් අත්තිකාරම් යටතේ ගිණුම් තබා තිබුණද සමාලෝචිත වර්ෂය අවසානය දක්වා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය.

## 3.1 කාර්යසාධනය

### 3.1.1 සැලසුම් කිරීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2003 ජූනි 02 දිනැති හා අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1 ඡේදය අනුව ආයතනයේ අනාගත ඉලක්ක සම්බන්ධ ක්‍රමෝපායන් ඇතුළත් සංයුක්ත සැලැස්මක් පිළියෙල කළ යුතු අතර චක්‍රලේඛයේ 5.1.3 ඡේදය පරිදි සංයුක්ත සැලැස්මේ යාවත්කාලීන පිටපතක් සෑම මූල්‍ය වර්ෂයක් ආරම්භවීමට අවම වශයෙන් දින 15 කට ප්‍රථම රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ යුතු නමුත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ආ) මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛයේ 4 ඡේදය ප්‍රකාරව නියාමන ආයතන විසින් පනතේ නියමකර ඇති පරමාර්ථ ඉටුකිරීම සඳහා ක්‍රියාකාරකම් ඇතුළත්කර ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතු නමුත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

**3.1.2 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය**

පනතේ අරමුණු ඉටුකර ගැනීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අරමුදල සතු කම්හල් 15 න් කම්හල් 03 ක් බදු පදනම මත බාහිර පුද්ගලයන් වෙත ලබා දී තිබූ අතර ක්‍රියාකාරීව පැවති කම්හල් 10 ක් 2015 වර්ෂයේදී රු.88,770,617 ක් අලාභ ලබා තිබුණි.

(ආ) සුභසාධන අංශය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩසටහන අනුව කම්හල් බදු දීමෙන් ලැබෙන ආදායමෙන් කොටස් හිමියන් වෙත ප්‍රතිලාභ ලබාදීම හා සුභසාධන රක්ෂණ අරමුදලින් කර්මාන්තශාලාවල කටයුතු සඳහා යෙදවූ රු.මිලියන 135 ක මුදල නැවත එම අරමුදලට ආපසු ලබාදීම කළ යුතු වුවද 2017 දෙසැම්බර් 31 දින දක්වා ඒ අනුව කටයුතුකර නොතිබුණු අතර සුභසාධන අරමුදල කුඩා තේ වතු සංවර්ධන අධිකාරියට පවරා දීම පමණක් සිදු කර තිබුණි.

(ii) 2015 දෙසැම්බර් 31 දිනට තේ ශක්ති අරමුදලේ කොටස් හිමියන් සංඛ්‍යාව 94,425 ක් වූ අතර එදිනට කොටස් ප්‍රාග්ධනය රු. 206,014,150 ක් විය. මෙම කොටස් හිමියන් සඳහා 2007 වර්ෂයෙන් පසුව මේ දක්වා ප්‍රතිලාභ ගෙවීමට හැකිවනු පිණිස අරමුදල මෙහෙයවා නොතිබුණි. සාමාජික කොටස් හිමියන් හා කුඩා තේ වතු හිමියන්ගේ කොටස් ප්‍රාග්ධන වටිනාකම ඉහළ දැමීම මගින් ආර්ථික සමාජ පැවැත්මේ අභිවර්ධනයට කැපවූ විශිෂ්ඨතම ආයතනය බවට පත්වීම ආයතනයේ දැක්ම වුවත් ඉහත සඳහන් කරුණු අනුව එම අරමුණ ඉටුකර ගැනීමට නොහැකිවී තිබුණි.

**3.2 ආයතනයට එරෙහිව හෝ ආයතනය විසින් ආරම්භකර ඇති නෛතික සිද්ධි**

2017 දෙසැම්බර් 31 දින වනවිට තේ ශක්ති අරමුදලට එරෙහිව කාර්ය මණ්ඩලය විසින් කම්කරු විනිශ්චය සභාවල නඩු 79 ක් ගොනුකර තිබුණි.

**3.3 කළමනාකරණ ක්‍රියාකාරකම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 ජුලි 13 දිනැති අංක 16/1427/726/015-I දරන දරන අමාත්‍ය මණ්ඩල තීරණ අනුව තේ ශක්ති අරමුදල සතු කර්මාන්තශාලා 12 හි කළමනාකාරීත්වය බදු පදනම මත බාහිර පාර්ශව වෙත පැවරීම සඳහා අනුමැතිය ලබා දී තිබුණි. එහෙත් කර්මාන්තශාලා බදු පදනම යටතේ ලබාදීමේදී එළඹ තිබූ ගිවිසුම් අනුව ඇතැම් කර්මාන්තශාලා භූමිය සහිතව බදු ලබාදී තිබූ බව නිරීක්ෂණය විය.

(ආ) රයිගම් කොරළේ තේ ශක්ති කර්මාන්තශාලාව දික්හේන කුඩා තේ වතු සංවර්ධන සමිතිය වෙත 2016 මැයි 09 දින අංක172 වන කළමනාකරණ මණ්ඩල රැස්වීම් තීරණය අනුව බදු දී තිබුණි. 2016 ජුනි 10 දින දෙපාර්ශවය අත්සන් තබා තිබූ අංක රහිත බදු ගිවිසුම, ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ ලියාපදිංචි කර නොතිබුණි. තවද බදු ගිවිසුමේ කොන්දේසි හා ගිවිසුමේ 2 ඡේදය ප්‍රකාරව ආපසු ගෙවන තැන්පත් මුදලක් වශයෙන් බදු ගැණුම්කාර පක්ෂය විසින් මාස 06 ක බදු කුලිය වන රු.1,500,000 ක් බදු දීමනාකාර පක්ෂයට ගෙවිය යුතු නමුත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ඇ) බදු ගැණුම්කරුවන් විසින් ඒ ඒ කර්මාන්තශාලා 09ක් වෙනුවෙන් තැන්පත් කරන ලද ආපසු ගෙවියයුතු මාස 06ක බදු මුදල වන රු.23,265,000 ක් ආයෝජනය කිරීමට දින15 සිට දින 239ක් දක්වා ප්‍රමාද වීම හේතුවෙන් රු.632,485 ක පොලිය අරමුදලට අහිමි වී තිබුණි.

(ඈ) කර්මාන්තශාලා බදු දීමේදී එළඹ තිබූ බදු ගිවිසුම් හා අවබෝධතා ගිවිසුම් අනුව අයවිය යුතු කළමනාකරණ ගාස්තුව/ මාසික බදු මුදල එම ගිවිසුම්හි දැක්වෙන 2 වන කොන්දේසිය අනුව අත්සන් කළ දින සිට ගණනය කර සටහන් කර තිබූ අතර, කර්මාන්තශාලාවන්හි නිෂ්පාදන කටයුතු ආරම්භකිරීම ප්‍රමාද වන අවස්ථාවන්හි බදු මුදල් ගෙවීමට මාස 02 ක සහන කාලයක් ලබාදෙන බවට 03 වන කොන්දේසියෙන් සඳහන් කර තිබුණි. එහෙත් සහන කාලය සඳහා බදු මුදල් අය නොකරන බව සඳහන් කර නොමැති වුවද කිසිදු කර්මාන්තශාලාවක බදු ගැණුම්කරුවන් විසින් සහනකාල සීමාව සඳහා බදු මුදල් ගෙවා නොතිබුණි. ඒ අනුව සහන කාල සීමාව සඳහා පහත පරිදි කර්මාන්තශාලා 11ක් හා පොහොර ගබඩාව සම්බන්ධයෙන් රු.10,845,700 ක් වූ මාසික බදු මුදල තේ ශක්ති අරමුදලට අහිමි වී තිබුණි.

(ඉ) සමාලෝචිත කාලපරිච්ඡේදයට අදාලව කර්මාන්තශාලා 05 ක මාසික බදු මුදල් රු. 7,280,000ක් මෙම වාර්තාවේ දින දක්වා හිඟව පැවතියද ගිවිසුම් ප්‍රකාරව කටයුතුකර නොතිබුණි.

(ඊ) කර්මාන්තශාලා බදුදීම සම්බන්ධයෙන් එළඹ තිබූ බදු ගිවිසුම්හි 07 වගන්තියේ සඳහන් ආකාරයට මාසික අමුදළු ධාරිතාවට සරිලන වටිනාකමක ප්‍රමාණයට තේ ශක්ති අරමුදල නමින් බැංකු ඇපකරයක් හෝ රක්ෂණාවරණයක් ලබාදිය යුතු නමුත් කර්මාන්තශාලා 11ක් බදු දීමේදී මෙම වගන්තියට අනුකූලව ලබාදියයුතු රු. 156,610,200 ක් වටිනා ඇපකර ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

### 3.4 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

-----------------------------------------

අරමුදලේ ප්‍රධාන කාර්යාලය හා සියලුම කම්හල් ඒකාබද්ධව ගිණුම් සැකසීම සඳහා වටිනාකම රු.2,435,000 ක් වූ පරිගණක මෘදුකාංග පද්ධතියක් 2010 වර්ෂයේදී මිලදී ගෙන තිබුණද, 2017 දෙසැම්බර් 31 දින වන විටත් ගිණුම් සැකසීමේ කටයුතු සඳහා එම පද්ධතිය භාවිතා කර නොතිබුණි.

### 3.5 ආර්ථික නොවන ගනුදෙනු

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 හා 2017 වර්ෂයන්හි දී දරන ලද අධිභාර සහ උසාවි දඩ මුදල් එකතුව රු.366,836 ක් හා විවිධ දඩ මුදල් රු.590,069 ක් ගෙවා තිබුණි.

(ආ) තේ කර්මාන්තශාලාවල විදුලි බිල් ප්‍රමාද වී ගෙවීම හේතුවෙන් ප්‍රමාද සඳහා පොළිය සහ විසන්ධි කළ සම්බන්ධතාවය නැවත ලබාදීමේ ගාස්තු ලෙස අරමුදල රු.108,356 ක් ගෙවා තිබුණි.

## 3.6 කාර්ය මණ්ඩල පරිපාලනය

2016 දෙසැම්බර් 31 දිනට තේ ශක්ති අරමුදලේ සේවයේ නියුක්තව සිටි සේවකයින් 83 දෙනෙකු අතරින් සේවකයින් 10 දෙනෙකු අමාත්‍යාංශය යටතේ පවතින වෙනත් ආයතන වලට අනුයුක්ත කර තිබූ අතර අට දෙනෙකු අරමුදලේ කටයුතු සඳහා යොදවා ගෙන තිබුණි.අ.ම.ප/16/2550/726/015-III දරන 2017 දෙසැම්බර් 21 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව සේවකයින් 65 දෙනෙකුගේ සේවය අවසන් කර තිබුණි.මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කෙරේ.

(අ) තේ ශක්ති අරමුදල පිහිටුවීමේ දී කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය යටතේ පැවැති කර්මාන්තශාලා පවරා ගෙන තිබූ අතර එම කර්මාන්තශාලාවන්හී සේවය කළ කාර්ය මණ්ඩලයේ පූර්ව සේවා කාලය ගණනය කිරීමේදී තේ ශක්ති අරමුදල යටතේ සේවයකළ කාලය පමණක් සැලකිල්ලට ගැනීම හේතුවෙන් 2016 මාර්තු 08 දිනැති අංක: 02/2016 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව නිළධාරීන් 17දෙනෙකුට වන්දි රු.7,409,660 ක් අඩුවෙන් ගණනයකර තිබුණි.

(ආ) අමාත්‍ය මණ්ඩල තීරණය අනුව, වන්දි යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමට නියමිත 2016 දෙසැම්බර්31 දින වනවිට සේවයේ නොසිටි මහවැලි කර්මාන්ත ශාලාවේ කනිෂ්ඨ සහකාර කම්හල් නිලධාරියෙකුට හා කම්හල් සුපරීක්ෂක වරයෙකුට එකතුව රු.1,849,669 ක වන්දි ගෙවා තිබුණි .

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

## 4.1 ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

### 4.1.1 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

තේ ශක්ති අරමුදල සතු කර්මාන්තශාලා බදු දීම සම්බන්ධයෙන් වූ 2016 ජූලි 13 දිනැති අංක අමප/16/1224/726/015-1 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව කර්මාන්තශාලා 12 ක් බදුදී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(i) මුදල් රෙගුලාසි 774 ප්‍රකාරව රජයට අයත් දේපල හෝ වරප්‍රසාද විකිණීමේදී රජයේ ටෙන්ඩර් ක්‍රියාපරිපාටි අනුගමනය කර විකුණුම්කරුවන් / බදු කරුවන් තෝරාගතයුතු වුවත් ඊට පටහැනි ලෙස අරමුදලට අයත් රයිගම් කෝරළේ තේ ශක්ති කම්හල ඍජුවම කුඩා තේ වතු සංවර්ධන සමිතියක් වෙත බදු දී තිබුණි. එම කුඩා තේ වතු සංවර්ධන සමිතියේ සභාපතිවරයා, කම්හලේ වැඩ බලන කළමනාකරු මෙන්ම අරමුදලේ කළමනාකරණ මණ්ඩලයේ අධ්‍යක්ෂවරයකු ද විය.

(ii) කර්මාන්තශාලා හා දේපල බදුදීම ආරම්භ කිරීමට පෙර ඒ ඒ කර්මාන්තශාලාවල වත්කම් හඳුනාගෙන තක්සේරු කිරීම හා බදු ආදායම් සඳහා මුල්‍ය ප්‍රවාහය ඇස්තමේන්තු ඇතුළත් කාලරාමුවක් පිළියෙල කිරීමට කටයුතු කර නොතිබුණි.

(iii) බදුදීමේ කටයුතු ආරම්භ කිරීමට පෙර කර්මාන්තශාලා වල තත්ත්වය හා ක්‍රියාකාරීත්වය පිළිබඳව සහ සංවර්ධන අවශ්‍යතා පිළිබඳව අධ්‍යයනයන් කර ඒ ඒ කර්මාන්තශාලාවලින් ලැබිය හැකි බදු ආදායම් සහ බදුගැණුම්කරුවන් සතුව තිබිය යුතු මූලික සුදුසුකම් පිළිබඳව හඳුනාගෙන නොතිබුණි.

**4.2** **අයවැය පාලනය**

------------------

අරමුදලේ කටයුතු සම්බන්ධයෙන් 2017 වර්ෂය සඳහා අයවැය ලේඛනයක් පිළියෙල කර නොතිබුණි.

**5.** **පද්ධති හා පාලනයන්**

-------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර අරමුදලේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) ගිණුම්කරණය | (i) මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් නොකිරීම.<br>(ii) මූලික ගිණුම් පොත්පත් හා ලේඛණ නිසි පරිදි නඩත්තු නොකිරීම. |
| (ආ) ආදායම | ලැබීම් සඳහා කුවිතාන්සි අනුපිළිවෙලට නිකුත් කල යුතු නමුත් ඒ අනුව කටයුතු කර නොතිබීම. |
| (ඇ) ලේඛන පවත්වාගැනීම | පාඩු හා හානි සම්බන්ධයෙන් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබීම. |
| (ඈ) ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂ | දීර්ඝ කාලීනව අයකර නොගත් හා නිරවුල් නොවූ ශේෂ පැවතීම. |
| (ඉ) කර්මාන්තශාලා මෙහෙයුම් | අරමුදලට අයත් සියළුම කර්මාන්තශාලා පාඩු ලැබීම හා කම්හල් බදු දීමේ ක්‍රියාවලියේ දුර්වලතා පැවතීම. |
| (ඊ) වත්කම් උපයෝජනය | නිෂ්කාර්ය වත්කම් පැවැතීම. |